01) බෝග වගාවේදී ප්‍රධාන උපස්ථරය හෙවත් වගා මාධ්‍ය ලෙස පස ඉතා වැදගත් වේ.

1. (අ) බෝග වගාවට පසෙන් ඉටුකරන ප්‍රධාන කාර්යයන් දෙකක් ලියන්න.
   (ආ) ශ්‍රී ලංකාවේ වියළි කලාපීය ප්‍රදේශවල බහුලවම දැකිය හැකි පස් වර්ගය නම් කරන්න.

2. (අ) පසෙහි අඩංගු විවිධ විශාලත්වයෙන් යුත් පාංශු ඛනිජ අංශුවල සාපේක්ෂ ව්‍යාප්තිය අනුව තීරණය කෙරෙන පාංශු ලක්ෂණය කුමක්ද ?
   (ආ) පසෙහි සිටින ජීවීන්ගෙන් සිදුවන කාර්යයන් දෙකක් ලියන්න.

3. පසෙහි කාබනික ද්‍රව්‍ය අඩංගු වීමේ ඇති වැදගත්කම් තුනක් සඳහන් කරන්න.

02) අවිධිමත් කෘෂිකාර්මික කටයුතු ඇතුළු මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් පසේ නිෂ්පදකතාව හීනවීම පාංශු හායනය ලෙස හැඳින්වේ.

1. පාංශු හායනයට හේතුවන කරුණු තුනක් ලියන්න.
2. බෝග වගාවට නුසුදුසු තත්ත්වයට පත් වූ (හායනයට පත්වූ) පසක් බෝගවගාවට සුදුසු තත්ත්වයට පත් කර ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග තුනක් ලියන්න.
3. (අ) පාංශු ඛාදනය යනු කුමක්දැයි අර්ථ දක්වන්න.
   (ආ) පාංශු සංරක්ෂණය සඳහා යොදා ගත හැකි ක්‍රම තුනක් ලියන්න.